# අතීත ලංකාවේ ප්‍රවාහනය සම්බන්ධයෙන් නිර්මාණය වී ඇති ජනකවි ඇතුලත් මූලාශ්‍ර පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනයක් : රුහුණු විශ්වවිද්‍යාල පුස්තකාලය ඇසුරින්

ආර්. ඒ. පී. සකුන්තලා සෙනෙවිරත්න[1]

**සංක්ෂේපය**

ජනශ්‍රැතිය යනුවෙන් හැඳින්වෙන්නේ ප්‍රාථමික හෝ සංකීර්ණ බවට පත් නූතන හෝ ජන සමූහයක් අතර කාලයක් තිස්සේ මුඛ පරම්පරාගත සම්ප්‍රදායෙන් ව්‍යාප්ත වූ ඥාන සම්භාරය යි. (රත්නපාල, 1985) ජනකතා, ජනප්‍රවාද, ජන කලාව, ජන නැටුම් මෙන්ම ජන කවිය ද ජනශ්‍රැති අධ්‍යයනයේ දී සුවිශේෂී විෂය ක්ෂේත්‍රයකි. අතීතයේ විසූවන් සිය අදහස් අන්‍යන්‍යයන් සමග හුවමාරු කර ගැනීම සඳහා ජන කවිය මාධ්‍යයක් කර ගෙන ඇති අතර විවිධ තේමා මුල් කර ගනිමින් මේවා නිර්මාණය වී ඇත. අතීත ජනයා ප්‍රවාහන කාර්යය සිදු කළ ආකාරය පිළිබඳ ව ජන කවියෙන් පෙන්වා දී ඇති අයුරු සොයා බැලීමත්, ඒවා ඇතුළත් මූලාශ්‍රය පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනයක් සිදු කිරිමත් මෙහි මූලික අරමුණ යි. රුහුණු විශ්වවිද්‍යාල පුස්තකාල එකතුව ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කරන ලද අතර මෙම එකතුවෙහි ජන කවිය සම්බන්ධයෙන් මූලාශ්‍රය සියයකට ආසන්න ප්‍රමාණයක් දැකිය හැකි ය. මෙම ජනකවි මූලාශ්‍රය බැහැර දෙන එකතුව, විමර්ශන එකතුව, නීතිමය තැන්පතු එකතුව හා ශ්‍රී ලංකා එකතුව යන අංශයන්හි තැන්පත් කර ඇති අතර ඉන් වැඩි ම මූලාශ්‍රය ප්‍රමාණයක් ඇත්තේ බැහැර දෙන එකතුව හා නීතිමය තැන්පතු එකතුව තුළ ය. මෙම ජනකවි මූලාශ්‍ර සියල්ලෙහි ම අතීත ලංකාවේ ප්‍රවාහනය සිදු කළ ආකාරය පිළිබඳ ජනකවි අන්තර්ගත වී නොමැති අතර මූලාශ්‍රය 45ක පමණ මේ සම්බන්ධ ජනකවි ලියැවී ඇත. නමුත් මෙම එකතුවෙහි ප්‍රවාහනය සම්බන්ධයෙන් පමණක් ලියැවී ඇති කෘති කිසිවක් නොමැති අතර ඇත්තේ වෙනත් ජනකවි වර්ග හා මිශ්‍රව තිබෙන ග්‍රන්ථ පමණකි. මෙම අධ්‍යයනය මඟින් පැහැදිලි වූයේ අතීත ජනතාව ප්‍රවාහනය සඳහා ගොඩබිම හා ජලය උපයෝගී කර ගත් බව යි. එහි දී ගොඩබිම සඳහා සතුන් සමග කරත්ත ද, ජලය හරහා ඔරු හා පාරු ද ප්‍රවාහනය සිදු කර ඇත. මේවා කරත්ත කවි, ගැල් කවි, තවලම් කවි මෙන්ම පාරු කවි, ඔරු කවි යනාදි වශයෙන් දැකිය හැකි ය. සමහර අවස්ථාවලදී එක් එක් ප්‍රදේශ පිළිබඳ සඳහන් ව ඇති අතර එකම කවිය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වී ඇති අයුරු ද පැහැදිලි ය. ඔවුන් නිරන්තරයෙන් දෙවියන්ගේ පිහිට පැතූ ආකාරය ද සඳහන් වේ. ඒ අනුව විවිධාකාරයේ කරත්ත කවි, ඔරු හා පාරු කවි සියයක් පමණ ද මෙම අධ්‍යයනයෙන් සොයා ගත හැකි විය. රුහුණු විශ්වවිද්‍යාල මාර්ගගත සුචිය (OPAC)ට ප්‍රවේශ වීමෙන් මෙම ග්‍රන්ථ විමර්ශනයට හැකියාව ඇත.

***මුඛ්‍ය පද:*** *කරත්ත කවි, පාරු කවි, පුස්තකාල එකතුව, ප්‍රවාහනය*

[1] රුහුණු විශ්වවිද්‍යාලය

saku@lib.ruh.ac.lk